ආරම්භය : 1945-09-30  ලි.ප. අංකය : කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

බෞද්ධෝදය



69 වර්ෂය - ශ්‍රී. බු. ව. 2558    2014 ජූනි 12    පොසොන් කලාපය

812 මාසික ධර්ම පත්‍රිකාව

# සොර සතුරන්ගෙන් මිහින්තලය රැකගත් දීඝභාණක අභය තෙරණුවෝ !

ගල්කිස්ස ශ්‍රී ධර්මපාලාරාමය සහ කතරගම උපාලි ධර්මාශ්‍රමාධිපති
ප්‍රවචන කීර්ති ශ්‍රී ශාසන ශෝභන
ශ්‍රී සුමංගල විද්‍යාවතංස - මහෝපාධ්‍යාය අග්ගමහා පණ්ඩිත
**කොටුගොඩ ධම්මාවාස අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස**

**“ ආදිත්තස්මිං අගාරස්මිං - යං නීහරති භාජනං**
**තං තස්ස හෝති අත්ථාය - නෝවයං තත්ථ ඩය්හරේ ”**

**“ ඒවමාදිප්පිතෝ ලෝකෝ - ජරාය මරණෝන ච**
**නීහරේථේව දානේන - දින්නං හෝති සුනීහතං ”**

(දේවතා සංයුත්තය ආදිත්ත සූත්‍රය.)

පසුගිය අප්‍රේල් මස දාහතර වැනි දිනට යෙදුණු බක් පොහෝ දින ධර්ම පත්‍රිකාවෙන් සතර සංග්‍රහ වස්තු පිළිබඳව විස්තර කරදීමේ බලාපොරොත්තුවෙන් එහි පළමු වැනි සංග්‍රහ වස්තුව වන දානය පිළිබඳව පෙරවදනක් සපයන ලදි. දානමය පුණ්‍ය ක්‍රියාව යනු ආහාර පානාදිය පමණක් දීම නොව තම කාලය - ශ්‍රමය - ධනය - බුද්ධිය මෙහෙයවා ගුණාත්මක ගති පැවතුම්වලින් තම ජීවිතය සරසාගත් විට ලැබෙන අමිල ආනිශංස පිළිබඳව ද විස්තර කරන ලදි. මෙම ධර්ම පත්‍රිකාවෙන් දානය පිළිබඳව තවදුරටත් විස්තර ඉදිරිපත් කරනු ලැබේ.

ගිනිගත් ගෙයකින් යම්කිසි දෙයක් ඉවතට ගතහොත් එය පසු කලෙක ප්‍රයෝජනය පිණිස පවතින්නේ ය. නැතහොත් ගෙය තුළ ම දැවී යන්නේ ය. එසේ ම මේ ලෝකය ජරා - මරණ - ක්‍රෝධ - තෘෂ්ණාදියෙන් ගිනිගෙන දැවෙ යි. දන් දීමෙන් - ගිනිගත් ලෝකයෙන් තමා සන්තක භාණ්ඩ බැහැර කරගත යුතු ය. එසේ බැහැර කරගත් දෙය ම මනාව රැකගත්තා වන්නේ ය යනු ඉහත සඳහන් ගාථාවන්ගේ අදහස යි. ලෝවැඩසඟරා කර්තෘ විදාගම මෛත්‍රෙය මාහිමිපාණන් වහන්සේ ද එම ගාථාවන්ගේ අදහස මෙසේ කවියට නගා ඇත.

**“ඇ තු ළ ට වැද ගෙය ඇවිලෙත ගින්නේ ”**
**පි ට ත ට හළ බඩු ම ය වැඩ වන්නේ යනුවෙනි**

පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් හෝ තමා සන්තක දෙයක් අනුන්ට දීමේ දි ඇතිවන චේතනාව දානය නමින් හඳුන්වනු ලැබේ. එසේ දෙන සෑම දෙයක් ම පාරමිතා ගණයට නො වැටෙන බව ධර්මානුකූලව කිවයුතුව ඇත. දානය පාරමිතාවක් වන්නට නම් විශේෂ ගුණ රාශියක් දායක පක්ෂය තුළ පිහිටිය යුතු ය. **"තණ්හා මාන දිට්ඨිහි අනුප්පහාය කරුණූපාය කෝසල්ල පරිග්ගහිතා චේතනාදයෝ ධම්මා පාරමියෝ නාම** " යන්නෙන් එම ගුණ පැහැදිලි කොට ඇත. තණ්හා - මාන - දිට්ඨි යන පාප චේතනාවන්ගෙන් තොරව - උපායශීලීත්වය නොහොත් අවස්ථාවෝචිත වූ ගුණයන්ගෙන් යුතුව දෙන්නේ නම් එය පාරමිතා ගණයට වැටෙන බව එයින් ප්‍රකාශ කොට ඇත. මහාබෝසත්වරු එසේ දන් දෙති. කෙනෙක් තෝරා බේරා වෙන්කර දීමක් ඔවුන් තුළ නැත. දිය කළයක් මුනින් නැමුවාක් මෙන් සැමට ම පොදුවේ සමසේ දන් දෙන්නාහු ය.

බොහෝ පුණ්‍යකර්මයන් අතර දානය ප්‍රමුකත්වයෙහි ලා සලකා ඇත. එදා අප මහා බෝසතාණෝ සුමේධ තාපසව සිට දීපංකර පාද මූලයෙහි නියත විවරණ ලබා බුදුරදුන් සහ විසිදහසක් රහතන් වහන්සේලා විසින් පුදන ලද මල්ගොඩ මත හිඳ දැන් මා ඒකාන්තයෙන් ම බුද්ධත්වයට පත්වෙයි. " අද්වෙජ්ජ වචනා බුද්ධා " බුදුවරුන්ගේ වචන දෙකක් නැත. බුදුවීම සඳහා කළ යුත්තේ කුමක්දැයි කල්පනා කරන විට එතුමන්ට වැටහුණේ " **දානපාරමිතං ගච්ජ - යදිබෝධිං පත්තුමිච්ජති** " බුද්ධත්වය ලබන්නට නම් පළමුවෙන් ම දාන පාරමිතාව පිරිය යුතු බව යි. දාන - සීල - භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්ගෙන් ද පළමු වැන්න දානය යි. දස රාජධර්මයන් අතර මුලට ම එන්නේ දානය යි. සතර සංග්‍රහ වස්තු අතර පළමු සංග්‍රහ වස්තුව දානයට හිමි වී ඇත.

දානයෙන් කෙරෙන්නේ ලෝභ - ද්වේෂ - මෝහ යන අකුශල මූලධර්මයන් තදංග වශයෙන් යටපත් කිරීම ය. බෝලයක් දිය යට ඔබාගෙන ඉන්නා කල් බෝලය දිය යට පවතී. අත බුරුල් වූ සැණෙකින් මතුවෙ යි. එමෙන් දන්දෙන අවස්ථාවේ ලෝභාදිය යටපත් වේ. පසුව යළි ඇති වේ. එසේ දානය පුරුදුකරගෙන යාමෙන් කාලාන්තරයක දී ලෝභා දී අකුසල් සහමුලින් ම දුරුකර දැමිය හැකි ය. දන් දෙන්නෝ ද විවිධ වෙති. සමහරු දීමට සුදුස්සන් සොයා නො ගොස් සිය නිවසට ප්‍රතිග්‍රාහකයෙකු පැමිණි විට තිබෙන දෙයකින් දන් දෙති. තව සමහරු නුදුනහොත් ලෝභියෙකැ යි ගැරහුම් ලැබේ යයි බියෙන් දන් දෙති අයෙක් තමන්ට යමක් දුන් තැනැත්තෙකුට තමා ළඟට පැමිණි විට සංග්‍රහ කිරීම් වශයෙන් දන් දෙති. තව සමහරු මේ තැනැත්තා මට අනාගතයෙහි ප්‍රයෝජනවත් වේවි යයි සිතා දෙති. අයෙක් දානය හොඳ දෙයකි. නැණ නුවණ ඇත්තෝ දන් දීමට ප්‍රශංසා කරති. එනිසා දිය යුතු යයි සිතා දෙති. සමහරු පැවිද්දන් නිවසට පැමිණි විට මේ අනුන්ගෙන් යැපෙන්නන් යයි සිතා දන් දෙති. කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවෙන් දන් දෙන්නෝ ද වෙති. අයෙක් සිතෙහි පවතින ලෝභය - මසුරුකම දුරුකර ගැනීමට දන් දෙති. එසේ දන් දෙනවා නම් එය උතුම් දානය යි.

දන් දී පැතුවත් නො පැතුවත් ස්වභාවයෙන් ම ස්වර්ග සම්පත්, මනුෂ්‍ය සම්පත් - ආයු - වර්ණ - සැප බල ප්‍රඥා ආදි සම්පත් ලැබෙන්නේ ය. මේ දානයෙන් මට ද ප්‍රතිග්‍රාහකයන් වහන්සේලා ලබා ඇති සීල - සමාධි - ප්‍රඥා - විමුක්ති - විමුක්ති ඥාන දර්ශනාදිය ලැබේවා ! යි පැතීමෙන් එම ගුණ සම්පත් ද ලැබිය හැකි ය.

එදා අලව් යකු බුදුරදුන්ගෙන් "කථං මිත්තානි ගන්ථති" කෙසේ මිත්‍රයන් එක්රැස් කරගන්නේ ද? යයි ඇසූ ඇසූ ප්‍රශ්නයට බුදුදුන්ගේ පිළිතුර වූයේ "දදං මිත්තානි ගන්ථති" දෙන්නා මිත්‍රයන් එක්රැස්කරගන්නා බව යි. "අදන්ත දමනං දානං" දීමෙන් අදාන්තයන් දමනය වේ යයි ධර්මයෙහි සඳහන්ව ඇත.

මෙහි ලා දැකවිය යුතු අගනා නිදසුන් කතා ප්‍රවෘත්තියක් දීඝනිකායේ මහා පරිනිර්වාණ සූත්‍ර වර්ණනාවෙහි දක්වා ඇත. දීඝභාණක අභය තෙරුන් වශයෙන් උන්වහන්සේගේ නම සඳහන් වේ. මේ කියන වකවානුව අනුරාධපුරය දේශපාලනික අර්බුදවලට මුහුණ දී අකර්මණ්‍යව පැවති කාල පරිච්ඡේදයකි. රටේ සොර සතුරු බිය වැඩිවිය. මිහින්තලා ප්‍රදේශය ම කොළොම් තොටින් මෙතෙර ත්‍රස්තවාදී චෞරයෙක් බලය අල්ලාගෙන ඒ ප්‍රදේශය බලාත්කාරයෙන් පාලනය කළේ ය. ජනතාව සන්තක දේපළ මංකොල්ලා කෑවේ ය. වෙහෙර විහාරස්ථානයන්ගෙන් ද නිදන්ගත වස්තු පැහැරගති. ඔහු යටපත් කරගෙන සිටි ප්‍රදේශවාසීන්ට පිට ප්‍රදේශයකට යාම තහනම් විය. එසේ යන්නේ නම් කහවණු ගණනාවක් ගෙවා යා යුතු ය. පිට ප්‍රදේශයකින් කෙනෙක් එන්නේ නම් ඔහු ද එසේම කළ යුතු විය. කල් යල් බලා ධනය උපයා ගතහැකි මගක් සෙවූ මේ ත්‍රස්තවාදියා භාර පන්සියක් පමණ දාමරික පිරිස ද කැටුව මිහින්තලා කන්දම වට කොට මුදුනට නැග ගත්තේ ය. විහාරය මංකොල්ලා කෑමට අභය නමැති චෞර ත්‍රස්තවාදියා පිරිසක් සමග පැමිණි බව භික්ෂූන් වහන්සේලා පිරිසක් විහාරාධිපති දීඝ භාණක අභය මහ තෙරුන්ට දැන්වූහ.

තෙරණුවෝ බියට පත්ව සිටි සියලු භික්ෂූන් කැඳවා මෙබඳු උපදේශයක් දුන්හ. " ඇවැත්නි, මේ අභය චෝර ත්‍රස්තවාදියා ගම් නියම්ගම් පැහැර ගනිමින්, අහිංසක ජනතාව ඝාතනය කරමින් ප්‍රදේශය ම විනාශ කරමින් ජීවත්වෙන බව රට ම දන්නා කරුණක් ! අනුරාධපුර රාජධානිය ද අරාජික වී ඇති බැවින් කියයුතු කෙනෙක් ද නෑ. දැන් ඔබ වහන්සේලා සියලු දෙනා ම ඔහු ගැනවත් ඔහුගේ පිරිස පිළිබඳවවත් කිසිදු ක්‍රෝධ සිතක් ඇති කොට නො ගෙන මිහින්තලා විහාරයෙහි ඇති මහජනයා පුදන ලද හාල් - පොල් - එළවලු වර්ග සියල්ල එක්රැස් කොට ගෙන ප්‍රණීත ලෙස රාත්‍රී කෑම හදා ඔවුන් කැඳවා සියල්ලන්ට ම කෑම බීම ආදියෙන් ආදර සහිතව සලකන්න. මේ අවස්ථාවේ අපට වෙන කළයුතු දෙයක් නැත. කෑමට ගතහැකි දේ එකතු කර උයා පිහා හොඳහැටි කන්න බොන්න දි - හෙට උදේ අපි සියල්ලෝ ම නිරාහාරව මෙහි සිටිය නො හැකි බැවින් පිට ප්‍රදේශයකට යමු. එසේ හිතාගෙන දැන් දානයක් පිරිනමන අදහසින් ම දිය යුතුය වහා ඔවුන්ට - සාමණේරවරු - වෙහෙරෙහි ආවතේව වැඩ කටයුතු කරන සියලු දෙනා එකතුව කෑම පිළියෙල කිරීමට උදව් දිය යුතු ය. තරුණ භික්ෂූන් වහන්සේලා සියල්ලෝ ම ද මේ පුණ්‍ය ක්‍රියාවට එක්විය යුතුය" යයි උපදෙස් දුන්හ.

දීඝභාණක අභය තෙරුන් වහන්සේ විසින් කරුණා පෙරදැරිව දෙන ලද උපදේශය පිළිගත් සියල්ලෝ ම හෝරා තුන හතරක් ගතවීමත් සමග ම බත් වර්ග - එළවළු වර්ග - පස්ගෝරස සියල්ල ම රැස්කොටගෙන දන්සැලක් බඳු තත්ත්වයෙන් කෑම පිළියෙල කළහ. ත්‍රස්තවාදි අභය චෞරයාට මේ බව දන්වා ඔහුගේ පිරිසට ම ඇතිවන තුරු ආහාර පාන දුන්හ. ප්‍රණීත වූ ආහාර පාන අනුභව කොට තෘප්තිමත් ව විහාරය මංකොල්ලා කෑමට සූදානම් වී මේ කෑම බීම කෙසේ ලැබුණි දැයි සාමණේර හිමිවරුන්ගෙන් විමසී ය. මිහින්තලා විහාරාධිපති දීඝභාණක අභය තෙරුන් විසින් අප සියලු දෙනා ම කැඳවා - වහා ඔබ සැමට ම ඉදිරි සතියකට හමාරකට අපට ආහාරයට තිබෙන දේ යොදා ප්‍රණීත ආහාරයක් පිළියෙල කර දෙන්න නියම කළේ ය. මේ ඉටුකළේ උන්වහන්සේගේ උපදේශය අනුව ය. මෙයින් මහත් සේ සතුටට පත් හොර දෙටුවා සිතන්නේ විරෝධය පළකිරීමට ආ කවර කෙනෙක් වුවද මරා දමා විහාරයේ තිබෙන සියල්ල ම පැහැරගෙන යාමට යි මම පන්සියයක් පමණ තරම් වූ මගේ පිරිසත් එක්ක මිහින්තලයට පැමිණියේ" ඒ බව දැනගත් මේ මහ තෙරණුවෝ තම ගෝල පිරිස යොදවා අපට බොහෝ උසස් අයුරින් කරුණා පෙරදැරිව සැලකුවා. එබඳු උත්තරීතර ගුණ ඇති හිමිනමකට ගරු කිරීම අපේ යුතු කමක් යයි සලකා පැහැදීමට පත්ව තෙරුන් වෙත ගොස් වැඳ සමාව ඉල්ලා මින් මතු මිහින්තලයට හානියක් නො කරන බවත් - හානියක් කිරීමට ඉඩ නො දෙන බවත් පවසා සතුටු සිතින් යුතුව තම පිරිසත් සමග ආපසු ගියේ ය.

රට සාමකාමී වීමෙන් පසු මේ කාරණය මත මිහින්තලයට අයත් සඟසතු දේ සොරුන්ට කෑමට දුන්හ" යි සංඝ සභාවෙන් චෝදනාවක් ඉදිරිපත් විය. සොරුන්ට කෑමට ගිය වියදමේ වටිනාකමත් - ඒ නිසා ආරක්ෂා වුණ විහාරයේ රන් කරඬු - ඇත්දළ - පුස්කොළපොත් - රන් පිළිම - රන් රිදී ද්‍රව්‍යයන් - භාජන - ලී බඩු - පලස් - මැණික් ප්‍රතිමා ඇඳ ඇතිරිලි - ඖෂධීය තෙල් බෙහෙත් ආදියෙහි වටිනා කමත් සංසන්දනය කොට බලද්දී පෙනීගියේ - සොරුන්ට ආහාර දීමට වැය වූ මුදලත් - සොරුන්ට කළ සුළු තෑගි භෝගවලත් වටිනාකමත් - ඒ වගේ ලක්ෂ ගණනක් වටිනා දේපළ ස්වාමෝචිත ප්‍රඥාවෙන් යුතුව සොරුන්ට ආහාරපාන සැපයීම නිසා ආරක්ෂා වී ඇති බව සනාථ විය. එනිසා උන්වහන්සේ ඒ චෝදනාවෙන් නිදහස් වූයේ ය. ඉහත සඳහන් කළ පරිදි "අදන්ත දමනං දානං" යනුවෙන් බුදුරදුන් වදාළ බණපදයට අනුව මිහින්තලා දීඝභාණක අභය මහ තෙරණුවෝ ක්‍රියා කොට ඇති බව මෙයින් අපට පැහැදිලි වන්නේ ය.